# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1988/22 - 2016 ඔක්තෝබර් මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2016.10.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xii)

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 140 වන වගන්තිය යටතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලබන නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2016 ඔක්තෝබර් මස 12 වැනි දින.
කොළඹ දී ය.

නියමාවලිය

1. මෙම නියමාවලිය 2016 අංක 02 දරන දේශීය වෛද්‍ය විද්‍යායතන (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට බලාත්මක විය යුතු ය.

2. 1996 පෙබරවාරි මස 09 වන දින අංක 909/13 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමාවලිය මගින් අවසන් වරට සංශෝධිත 1979 දෙසැම්බර් මස 21 වන දින අංක 67/14 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1979 අංක 7 දරන දේශීය වෛද්‍ය විද්‍යායතන නියමාවලිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 5 වන ජේදයේ (ඈ) අනු ජේදයේ ''උපාධි'' යන වචනය වෙනුවට ''පශ්චාත් උපාධි, උපාධි'' යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එහි 12 වන ජේදයේ 3 (උ) අනු ජේදයේ ''උපාධි'' යන වචනය වෙනුවට ''පශ්චාත් උපාධි, උපාධි'' යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එහි 13 වන ජේදයේ ''එක් අධ්‍යාන අංශයක් බැගින්'' යන වචන වෙනුවට ''අධ්‍යාන අංශ'' යන වචන ආදේශ කිරීමෙන්.

10 - 1667/1

එල්.ඩී.බී. 21/78 (xiii)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ හා 24ආ වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 18 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලබන නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2016 ඔක්තෝබර් මස 12 වැනි දින.
කොළඹ දී ය.

නියමාවලිය

1. මෙම නියමාවලිය 2016 අංක 03 දරන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතන (සංශෝධන) නියමාවලිය යනුවෙන් සඳහන් කරනු ලබන අතර එය *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට බලාත්මක විය යුතු ය.

2. 1996 පෙබරවාරි මස 09 වන දින අංක 909/13 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමාවලිය මගින් අවසන් වරට සංශෝධිත 1995 මාර්තු මස 13 වන දින අංක 862/8 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1995 අංක 01 දරන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතන නියමාවලිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 4 වන ජේදයේ (ඉ) උප ජේදයේ ''උපාධි'' යන වචනය වෙනුවට ''පශ්චාත් උපාධි, උපාධි'' යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම නියෝගවල 11 වන ජේදයේ 2 (ඊ) අනු ජේදය ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන අනු ජේදය ආදේශ කිරීමෙන් ;

''(ඊ) ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ විවිධ අංශයන්හි ප්‍රදානය කළ යුතු පශ්චාත් උපාධි, උපාධි, ඩිප්ලෝමා, සහතික සහ අනෙකුත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා පිළිබඳවත්, හැදෑරිය යුතු අධ්‍යයන පාඨමාලා, ලැබිය යුතු පුහුණුව, සාමාර්ථය ලැබිය යුතු විභාග පිළිබඳවත්, එවැනි පශ්චාත් උපාධි, උපාධි, ඩිප්ලෝමා සහතික සහ ශාස්ත්‍රීය විශිෂ්ඨතාවලට සුදුස්සන් වීමේ අභිලාෂය ඇති ශිෂ්‍යයන් විසින් සපුරාලිය යුතු වෙනත් කොන්දේසි පිළිබඳවත් අදාළ අධ්‍යයන අංශ කමිටුව හෝ කමිටු විමසීමෙන් පසු විශ්වවිද්‍යාලයට නිර්දේශ ඉදිරිපත් කිරීම.''.

(3) එහි 15 වන ජේදයේ (ඉ) උප ජේදයේ ''උපාධි'' යන වචන වෙනුවට ''පශ්චාත් උපාධි, උපාධි'' යන වචන ආදේශ කිරීමෙන්.

10 - 1667/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.